සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 03 |

**උපදෙස් :**

**මෙම කොටස අනු කොටස් තුනකින් සමන්විත ය.**

**‘අ’ කොටසින් ප්‍රශ්න දෙකක් හා ‘ආ’ සහ ‘ඉ’ යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන. ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

**(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)**

## ‘අ’ කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. අනුරාධපුර හා පොළොන්නරු යුගවල බුද්ධ ප්‍රතිමා කලාව මෙන් ම දේශීය කැටයම් කලාව පිළිබඳව ද තොරතුරු හෙළිදරව් කරයි.

   I. අනුරාධපුර යුගයේ ගුප්ත හා අමරාවතී ආභාසය සහිත බුද්ධ ප්‍රතිමාව බැගින් පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 2යි.)

   II. පොළොන්නරු විද්‍යාධර ගුහාව හා එහි ඇති කලාත්මක දෑ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5යි.)

   III. ඉසුරුමුණි විහාරය බෞද්ධ විහාරස්ථානයක් වුවද එහි ඇති කැටයම් ආගමික වස්තු විෂයයන්ගෙන් වෙනස් වූ තේමාවන් නිරූපණය කර ඇති ආකාරය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

2. ඇම්බැක්කේ දේවාලය හා පනාවිටිය අම්බලම දේශීය කැටයම් කලාවට නව අරුතක් හඳුන්වා දීමට සමත් විය.

   I. ඇම්බැක්කේ දේවාලයෙහි කැටයම් ඇති ප්‍රධාන ස්ථාන දෙක සඳහන් කරන්න.

II. ඇම්බැක්කේ ලී කැටයම් ප්‍රධාන කාණ්ඩ කිහිපයකට වර්ග කළ හැකි ය. උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි.)

III. ඇම්බැක්කේ දේවාලයේ හා පනාවිටිය අම්බලමේ වාස්තු විද්‍යාත්මක අංග මෙන් ම කැටයම් පිළිබඳ සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 8යි.)

3. මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය උඩරට මෙන්ම පහතරට විහාරස්ථාන කරාද පැතිර ගියේ ය.

I. මහනුවර සම්ප්‍රදායේ සිතුවම් ඇති උඩරට හා පහතරට විහාරස්ථානය බැගින් ලියන්න. (ලකුණු 2යි.)

II. මහනුවර සම්ප්‍රදායේ පහතරට විහාරස්ථානයන් හි සිතුවම් ඇඳීමේ දී විදේශීය ආභාසයන් දැකගත හැකි ය. මේ පිළිබඳ උදාහරණ සහිතව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5යි.)

III. මහනුවර යුගයේ උඩරට හා පහතරට සිතුවම්වල දැකිය හැකි පොදු විශේෂතා පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 8යි.)

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. අජන්තා ලෙන් සමූහය බෞද්ධ කලා නිර්මාණයන්ගෙන් සුසැදි අගනා කලාගාරයක් විය.

I. අජන්තා ලෙන්හි ගෘහ නිර්මාණ සැලැස්ම අනුව ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 2යි.)

II. අජන්තා ගුහා කාල පරාසයන් අනුව කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය. කෙටියෙන පැහැදිලි කරන්න. (ලකුණු 5යි.)

III. අජන්තා අංක 1 සහ 2 ගුහාවල සිතුවම් අජන්තා ශිල්පියාගේ පරිණත බව පෙන්නුම් කරයි. පැහැදිලි කරන්න. (ලකුණු 8යි.)

5. දකුණු ඉන්දියාවේ බලය අත්කරගත් චෝල පාලකයින් ගෘහ නිර්මාණ හා මූර්ති කලා නිර්මාණ රැසක භාරත දේශයට දායාද කෙරිණි.

I. චෝල මූර්ති නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 2යි.)

II. රාජ රාජේශ්වර දේවාලයේ ගෘහ නිර්මාණ ලක්ෂණ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි.)

III. ලෝකඩ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය චෝලයින් සතුවිය. උදාහරණ දෙකක් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 8යි.)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

6. ලෝකයේ ඉපැරණිම හා දීර්ඝතම ශිෂ්ටාචාරය ලෙස හැඳින්වෙන මිසර ශිෂ්ටාචාරය නයින් මිටියාවත කේන්ද්‍රකර ගනිමින් ව්‍යාප්ත වී ඇත.

   I. මිසර දේවස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 2යි.)

   II. පිරමීඩය නිර්මාණය ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයකි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි.)

   III. ඊජිප්තු මූර්ති නිර්මාණය සඳහා ඔවුන්ගේ ආගමික ඇදහිලි විශ්වාස පදනම් වී ඇති අතර මුල් කාලීන මිසර මූර්ති තුළ සාම්ප්‍රදායික ලක්ෂණ ද පසුකාලීන මූර්ති තුළ ස්වභාවිකත්වයට අනුරූපව නිර්මාණය කිරීම් ද දැකගත හැකිය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 8යි.)

7. විසිවන සියවසේ යුරෝපයේ පැන නැගුණු පෙරටුගාමී කලා ව්‍යාපාර කිහිපයක් විය.

   I. උපස්ථිතිවාදී ශිල්පියෙක් හා ශිල්පිනියක් නම් කරන්න. (ලකුණු 2යි.)

   II. පෝල් ගොගැන්ගේ සිතුවම්වල දැකිය හැකි සංකේත භාවය හා වියුක්තකරණය උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි.)

   III. ඝණිකවාදී කලාව බිහිවීම කෙරෙහි පෝල් සෙසන්ගේ අත්හදා බැලීම් ද බලපා තිබේ. ඝණිකවාදී කලාවේ වස්තු විෂය හා කලාත්මක ප්‍රයෝග පිළිබඳ ව හැඳින්වීමක් කරන්න. (ලකුණු 8යි.)